විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව

ஓய்வூதியத் திணைக்களம்
DEPARTMENT OF PENSIONS

ශ්‍රී ලංකා විශ්‍රාම
இலங்கை ஓய்வு
Sri Lanka Pensions

පරපුරක අභිමානය　　தலைமுறையொன்றின் பெருமிதம்　　Pride of a Generation

මගේ අංකය / எனது இல. / My No. } Pen/Pol/06/11-2023　　ඔබේ අංකය / உமது இல. / Your No. } ..........................　　දිනය / திகதி / Date } 2024.04.02

**විශ්‍රාම වැටුප් උපදෙස් ලිපි :- 01/2024**

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්

පළාත් ප්‍රධාන ලේකම්වරුන්

සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන් / සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන්

සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන්

පළාත් පාලන ආයතන ප්‍රධානීන්

**වැන්දඹු / වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප සඳහා හිඟ දායක මුදල් අයකිරීමේ දී ඊට අදාළව පොළිය අය කළ යුතු ආකාරය**

උක්ත කරුණ සම්බන්ධයෙන් 2008.01.30 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 03/2008 හා 2023.06.01 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 03/2008 (සංශෝධන I) කෙරෙහි කාරුණික අවධානය යොමු කරවමි.

02. 2023.06.01 දිනට පෙර කාලසීමාවන්ට අදාළව වැන්දඹු / වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප සඳහා හිඟ දායක මුදල් අයකිරීමේ දී විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 03/2008 හි විධිවිධාන අනුව 4%ක සුළු පොළිය අය කිරීමට කටයුතු කළ යුතු ය.

03. විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 03/2008 (සංශෝධන I) හි විධිවිධාන 2023.06.01 දින සිට බලාත්මක වීම සිදු වන බැවින්, එදින සිට වැන්දඹු / වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප සඳහා හිඟ දායක මුදල් අයකිරීමේ දී විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 03/2008 (සංශෝධන I) හි විධිවිධාන අනුව 4%ක වැල් පොළිය අය කිරීමට කටයුතු කළ යුතු ය.

04. 2023.06.01 දිනට පෙර කාල සීමාවකට අදාළ හිඟ දායක මුදලක් 2023.06.01 දිනෙන් පසුව අය කර ගනු ලබන්නේ නම් ඒ සඳහා අය කළ යුත්තේ 4%ක සුළු පොළියකි. ඒ අනුව අය කළ යුතු පොළිය, හිඟ දායක මුදල අදාළ වන කාලසීමාව අනුව තීරණය කළ යුතු ය.

**ජී. ජගත් ඩී. ඩයස්**
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්

**පිටපත :-** ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය } ඔබගේ Pns/P5/08/19 හා 2024.02.28 දිනැති ලිපිය පරිදි කරු. දැ.ගැ.ස.

**මාළිගාවත්ත, කොළඹ 10.** மாளிகாவத்தை கொழும்பு 10. Maligawatta, Colombo 10.
Hot line: 1970, Direct line: 2209800, Fax: 2342078, Email: info@pensions.gov.lk, Web: www.pensions.gov.lk